**ශීර්ෂය 256 - ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව -2013 වර්ෂය**
**----------------------------------------------------------**

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිළිඳුකම අඩු කිරීම සඳහා වන මුලපිරීම

(ආ) මැතිවරණ සම්බන්ධීකරණය

(ඇ) සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම හා අධීක්ෂණය

(ඈ) ආපදා සහන ව්‍යාපෘතීන් සහ පුනරුත්ථාපන ව්‍යාපෘතීන් පරිපාලනය

(ඉ) දිස්ත්‍රික් ව්‍යාපෘතීන් පරිපාලනය හා මඟ පෙන්වීම

(ඊ) ආදායම් එකතු කිරීම

1.2 **දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (අ) | ගම්පහ | (ඉ) | කටාන | (එ) | වත්තල | (ක) | බියගම |
| (ආ) | මිනුවන්ගොඩ | (ඊ) | මීගමුව | (ඒ) | මහර | | |
| (ඇ) | දිවුලපිටිය | (උ) | අත්තනගල්ල | (ඔ) | දොම්පෙ | | |
| (ඈ) | මීරිගම | (ඌ) | ජාඇල | (ඕ) | කැලණිය | | |

**1.3 විගණන විෂය පථය**

ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අගෝස්තු 18 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

-----------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි හා පාඩු ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

**(ආ) විසර්ජන ගිණුම**

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.861,051,707 ක්වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.803,779,312 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.57,272,395 ක් හෙවත් සියයට 6.65 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 799,751,707 | 768,018,358 | 31,733,349 | 3.96 |
| මූලධන | 61,300,000 | 35,760,954 | 25,539,046 | 41.66 |
| එකතුව | **861,051,707** | **803,779,312** | **57,272,395** | **6.65** |

**(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.5,864,214,886 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු අතර එම ප්‍රතිපාදන පිළිවෙළින් රු.2,309,192,842 ක් හා රු.3,407,868,495 ක් වශයෙන් එකතුව රු.5,717,061,337 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.125,459,588 ක් හා රු.21,693,961 ක් වශයෙන් එකතුව රු.147,153,549 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියන් ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් පිළිවෙළින් සියයට 5.15 ක් හා සියයට 0.63 ක් වි තිබුණි.

(ඇ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 25601 | 68,000,000 | 64,290,194 | 54,000,000 | 57,337,958 | 240,000,000 | 232,842,469 |

විෂය අංක 25601 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,612,708 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ඇ) **පොදු තැන්පත් ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.470,535,812 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 2 ක් ඉක්මවූ රු.1,192,685 ක්වූ පොදු තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වර්ෂ 10 ඉක්මවූ රු.16,729,602 ක ඉඩම් තැන්පතු ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571(2) පරිදි කටයුතු කර නොතිබුණි.

(iii) කැළණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ව්‍යාපෘතීන් දෙකක් සඳහා 2012 වර්ෂයේදී ලබාදී තිබුණු රු.100,000 ක් අදාළ කාර්යයන්හි උපයෝජනය නොකර ආපසු යවා තිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල නිවාසයක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව/ ඒකක ගණන | වත්කම් ලබාදී ඇති ආයතනය |
|---|---|---|---|
| (i) | නිල නිවාස ගොඩනැගිලි | 01 | ජාතික තරුණ සේවා සභාව-උඩුගම්පොළ |
| (ii) | - එම - | 01 | සමෘද්ධි බැංකුව- හොරම්පැල්ල |

(iii) මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ උන්නාරුව පිහිටි නිල නිවසක අනවසරයෙන් පවුලක් පදිංචිව **තිබුණි.**

(iv) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 5 ක නිල නිවාස 7 ක් ග්‍රාම නිලධාරී කාර්යාල පවත්වාගෙන යාම සඳහා යොදාගෙන තිබුණි.

## 1.8 අනුකූල නොවීම්

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| | මුදල් රෙගුලාසි 1646 | ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අනුයුක්ත සංචිත වාහනවලට අදාළ 2013 වර්ෂය වෙනුවෙන් වූ දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | **භාණ්ඩාගාර චක්‍රලේඛ** | |
| | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන චක්‍රලේඛය | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පවතින සියළුම පරිගණක, උපාංග හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් පරිගණක වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. |
| (ඇ) | ගම්පහ දිස්ත්‍රික් ලේකම්ගේ අංක:1/8/18 හා 2007 ජූනි 27 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛය | වර්ෂයකට සිව් වතාවක් එක් ග්‍රාම නිලධාරී කාර්යාලයක් පරීක්ෂා කළ යුතු වුවත්, මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී කාර්යාල 84 ක් 2013 වර්ෂය තුළදී එක් වරක් හෝ පරීක්ෂා කර නොතිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ඉටු කිරීමේදී පහත සඳහන් ප්‍රමාදයන් විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය විය.

### (අ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | නිම කළ යුතු දිනය | 2013.12.31 දිනට ප්‍රගතිය | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| | රු. | | සියයට | |
| සේවා පියස ඉදිකිරීම - කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 1,826,435 | 2013.12.31 | 75 | මුදල් නොලැබීම |
| සේවා පියස ඉදිකිරීම - බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 750,000 | 2013.12.31 | 75 | නියමිත පරිදි ඇස්තමේන්තු පිළියෙල නොකිරීම |

(ii) දිසත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේදී ප්‍රමාදයන් සිදු වී තිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දිනට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|
| | රු.මිලියන | | රු.මිලියන | |
| මාර්ග කාපට් කිරීම | 573.6 | 2013.12.31 | 265.3 | ජලනල එළීමේ ප්‍රමාදයන් |
| නගර සංවර්ධන වැඩසටහන | 6.9 | 2013.12.31 | 5.2 | ව්‍යාපෘති අනුමත කිරීමේ ප්‍රමාදයන් |
| දොම්පෙ රෝහල ප්‍රතිසංස්කරණය කිරීම | 11.3 | 2013.12.31 | 11.3 | වැරදි ඇස්තමේන්තු හේතුවෙන් |
| මීගමුව රාත්‍රී පොල ඉදිකිරීම | 50.0 | 2013.12.31 | 50.0 | භූමිය නිරවුල් නොවීම |
| බටහිර රන් අරුණ වැඩසටහන | 270.0 | 2013.12.31 | 270.0 | අමාත්‍යාංශ අනුමැතිය නොලැබීම |

(ආ) **මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකක නව ගොඩනැගිලි ඉදි කිරීමේ මූලික කටයුතු වෙනුවෙන් 2013 වර්ෂයේදී වාර්ෂික අයවැය ඇස්තමේන්තු අනුව රුපියල් මිලියන 26 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ප්‍රතිපාදනවලින් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සියයට 97 ක ප්‍රමාණයක් ඉතිරිව තිබුණි.

## 1.10 **අවිධිමත් ගනුදෙනු**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කීපයක් පහත දැක්වේ.

(අ) 2013 මැයි 28 දින රු.183,480 ක්වූ මුදලකට ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පරිගණක දෙකක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. මිලදී ගත් උපකරණ අදාළ පිරිවිතරයන්ට අනුකූල වී නොතිබුණි.

(ආ) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයේදී රු.690,000 ක්වූ මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්ස් 3 ක් මිලදී ගෙන තිබුණි. ලංසු ඉදිරිපත් කළ යුතු අවසාන දිනය ලෙස 2013 නොවැම්බර් 25 දින ප්‍රකාශ කර තිබුණි. පසුව ඉදිරිපත් කරන ලද ලංසු ඇගයීමට ලක් කිරීමත්, ඉදිරිපත් කරන ලද ලංසු විවිධ දිනයන්හි විවෘත කිරීමත්, අදාළ පිරිවිතරයන්ට අනුකූල වන පරිදි තාක්ෂණික ඇගයීම් වාර්තාවක් පිළියෙල නොකිරීමත් හා ඉදිරිපත් වූ සියළු ලංසු ඇගයීමට ලක් කිරීමද සිදු කර නොතිබුණි.

## 1.11 **පාඩු හා හානි**

පාඩු හා හානිවීම් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කැබ් රථයක් 2013 මාර්තු 01 දින අනතුරකට පත්වීමෙන් වූ පාඩු හා හානි විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට ඇතුළත් කර නොතිබුණි.

(ආ) වාහන දෙකක් අනතුරුවලට භාජනය වී තිබෙන බවට විසර්ජන ගිණුමේ දක්වා තිබුණද, ඒ පිළිබඳ විස්තර හානි හා පාඩු ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) කැබ් රථ දෙකක් අනතුරුවලට භාජනය වී වර්ෂ 3-7 අතර කාලයක් ගතවී තිබුණු අතර, එම අලාභයන් වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොත්වලින් කපා හැරීමට හෝ පියවර ගෙන නොතිබුණි.

(ඈ) අලාභ හානිය සිදුවූ වහාම මුදල් රෙගුලාසි 104(3) හා (4) පරිදි ප්‍රාරම්භක වාර්තාවක් සහ එම අලාභ හානිය සිදුවී මාස 03 ක් ඇතුළත පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත්, 2013 මාර්තු 01 දින හා 2013 සැප්තැම්බර් 04 දින සිදුවූ වාහන අනතුරු දෙක සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ඉ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකකට අයත් හානි පිළිබඳ විස්තර හානි හා පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි.

## 1.12 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රන් අරුණ ලිය අභිමන් වැඩ සටහන යටතේ අඩු ආදායම්ලාභී පවුල්වල ජීවන තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් බෙදාහැර තිබුණු උපකරණ කට්ටල් 11 කින් කට්ටල් 3 ක් නිෂ්ක්‍රියව පවතින බවට අදාළ පසු විපරම් වාර්තාවට අනුව හෙළිදරව් කර තිබුණි.

(ආ) ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 3 කින් ආධාරලාභීන් වෙත බෙදාදී තිබුණු කිකිළි පැටවුන් සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | අදාළ වර්ෂ/ වර්ෂය | බෙදාදී තිබුණු කිකිළි /කුකුළු පැටවුන් සංඛ්‍යාව | මියගොස් තිබුණු කිකිළි / කුකුළු පැටවුන් සංඛ්‍යාව | කිකිළි පැටවුන් අතර සිටි කුකුළු පැටවුන් ගණන | පසු විපරම් තොරතුරු ලබාගෙන නොමැති පැටවුන් ගණන |
|---|---|---|---|---|---|
| අත්තනගල්ල | 2011,2012 සහ 2013 | 16,360 | 2,878 | 1,741 | 6,955 |
| කැළණිය | 2013 | 2,500 | - | - | 2,500 |
| බියගම | 2012 | 916 | 395 | 168 | 353 |
| එකතුව | | 19,776 | 3,273 | 1,909 | 9,808 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් බෙදා දී තිබුණු කිකිළි පැටවුන් 16,360 න් 6,955 ක් පිළිබඳ පසුවිපරම් කටයුතු සිදු කර නොතිබුණි. පසුවිපරම් සිදු කළ කිකිළි පැටවුන් 9,405 කින් මිය ගිය පැටවුන් සංඛ්‍යාව හා කිකිළි පැටවුන් වෙනුවට ලැබී තිබුණු කුකුළු පැටවුන් සංඛ්‍යාවේ අලාභයේ වටිනාකම මුළු වියදමෙන් සියයට 49 ක් හෙවත් රු.1,443,530 ක් වී තිබුණි.

(ii) බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් බෙදාදී තිබුණු කිකිළි පැටවුන් 916 න් මියගොස් තිබුණු පැටවුන් සංඛ්‍යාව සහ කිකිළි පැටවුන් වෙනුවට ලැබී තිබුණු කුකුළු පැටවුන් සංඛ්‍යාව අනුව සිදුකර තිබුණු වියදමෙන් සියයට 61 කට සමාන එනම් රු.175,948 ක් අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි.

(iii) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බෙදාදී තිබුණු කිකිළි පැටවුන් සම්බන්ධයෙන් පසු විපරම් වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් ඉහත පරිදි වූ විශ්ලේෂණයක් කළ නොහැකි විය.

(ඇ) දිවිනැගුම වැඩ සටහන යටතේ, 2012 වර්ෂයේදී ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් බෙදාදී තිබුණු පලතුරු පැළ14,476 න් පසු විපරම් කටයුතු සිදුකර තිබුණු පලතුරු පැළ 6,884 කින් සියයට 21 කට සමාන පැළ ප්‍රමාණයක් විනාශවී තිබුණු අතර, එම පැළ ගම්පහ දිස්ත්‍රික්කයේ දේශගුණයට අනුගත නොවන මිදි වැන පැළ වර්ග වී තිබුණි.

## 1.13 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ විමධ්‍යගත ප්‍රතිපාදන මගින් මීරිගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු රු.427,460 ක්වූ විවිධ වර්ගවලට අයත් උපකරණ 165 ක ප්‍රමාණයක් 2014 ඔක්තෝබර් මාසය වන විටද අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදී නොතිබුණි.

(ආ) සංවර්ධන ව්‍යාපෘති 02 ක් යටතේ බෙදාදීම සඳහා බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.236,400 ක්වූ භාණ්ඩ අයිතම 273 ක් කාර්යාල භූමියේ සහ ගබඩාවේ තබා තිබුණි.

(ඇ) ගම්පහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයන් දෙදෙනෙක් මියගොස් තිබුණු මාසයට පසු මාසය සඳහා එකතුව රු.26,117 ක්වූ විශ්‍රාම වැටුප් මුදල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ගෙවා තිබුණු අතර, එම මුදල් ආපසු අයකර ගෙන නොතිබුණි.

(ඇ) කැලණිය ප්‍රාදේශීය ලේකම් කාර්යලයෙන් විශ්‍රාම වැටුප් ලබමින් සිටින විශ්‍රාමිකයන්ගෙන් 2011 ජූලි සිට 2013 ජනවාරි දක්වා කාලය තුළ මියගොස් තිබෙන විශ්‍රාමිකයින් 9 දෙනෙකුට විශ්‍රාම වැටුප් වශයෙන් එකතුව රු.416,782 ක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඒ ඒ පුද්ගල බැංකු ගිණුම්වලට ප්‍රේෂණය කර තිබුණු අතර, එම මුදලින් රු.244,795 ක් ආපසු අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයකට පත්ව තිබුණි.

(ඉ) අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පළතුරු පැළ බෙදාහැරීමේ අපේක්ෂිත ඉලක්කය 44,742 ක් වුවද 2011වර්ෂයේ පසු විපරම් වාර්තා අනුව බෙදාහැර තිබූ පළතුරු පැල සංඛ්‍යාව 29,202 ක් පමණක් වී තිබුණි.

## 1.14 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 46 | 37 | 09 | |
| (ii) | තෘතියික මට්ටම | 27 | 22 | 05 | |
| (iii) | ද්විතියික මට්ටම | 1677 | 1339 | 338 | |
| (iv) | ප්‍රාථමික මට්ටම | 129 | 111 | 20 | 02 |
| | එකතුව | 1879 | 1509 | 372 | 02 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 370 ක් පිරවීමට ආයතනය අපොහොසත් වී තිබුණි.
ස්ථාන මාරුවීම් මත ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබෙන රියදුරන් දෙදෙනෙකුගේ අතිරික්තයක් සිදුවී තිබුණි